9
2016

Living the LOTUS
Buddhism in Everyday Life

VOL. 132

FOUNDER’S ESSAY

## අව්‍යාජ හදවතේ සුපිපෙන මල

ප්‍රකට කාටූන් චිත්‍ර ශිල්පීන් තම ගෝල ශිෂ්‍යයන් තෝරා ගැනීමේදී චිත්‍ර ඇඳීමට ඇති හැකියාවට වඩා පෞරුෂත්ව ගතිගුණ වැදගත් කොට සලකන බව පැවසේ. චිත්‍ර ඇඳිය නොහැකි කෙනෙකු කාටූන් චිත්‍ර ශිල්පියෙකු ලෙස කටයුතු කරන්නේ කෙසේද, සිතෙන්නට පුළුවන. නමුදු මනුෂ්‍යයෙකු යම් දෙයකට සිත ඒකාග්‍රතාවයෙන් යුතුව කටයුතු කරනවා නම් ‘‘කිසිත් කළ නොහැකියි’’ ලෙස සිතූ පුද්ගලයන් පවා ‘විපර්යාසයන්’ පාමින් ඉතා ඉක්මණින් වෙනස් වේයැයි සඳහන් වේ. එය මහත් පුදුමයක් නොවේද?

බුද්ධ ශ්‍රාවකයෙකු වන චුල්ල පන්තක තෙරුණ්ට එක් ගාථාවක් හෝ මතක තබා ගැනීමට නොහැකි විය. නමුදු බුදුන් වහන්සේ දේශනා කළ පරිදි ‘මම පන්සල පිරිසිදු කරමි’ යන එකම එක ක්‍රියාව සිතේ ඒකග්‍රතාවයෙන් යුතුව නිතිපතා පන්සල පිරිසිදු කිරීම සිදු කළහ. මෙලෙස කටයුතු කරන එක් දිනක උන් වහන්සේට සත්‍යාවබෝධය ලබා ගැනීමට හැකිවිය. මෙයද කලින් සඳහන් කළ කථාව හා සමානය. තම ගුරුවරයාගේ ඔවදන් අනුව උනන්දුවෙන් කැපවීමෙන් දිගටම අව්‍යාජ හදවතින් සිටින විට අපගේ ඇතුලාන්තයේ නොපෙනී පවත්නා වූ මල අනිවාර්යයෙන්ම පිපේවි.

නිර්මාතෘ සංකල්පනා 8 පි. 100-101

Living the Lotus
Vol. 132 (September 2016)

【ප්‍රකාශනය】 රිෂ්ෂෝ කෝසෙයි කායි,
අන්තර්ජාතික මුලස්ථානය
5F ෆුමොන් ශාලාව
2-6-1 වඩ, සුගිනමි කු, ටෝකියෝ, 166-8537
Tel: +81-3-5341-1124
Fax: +81-3-5341-1224
E-mail: living.the.lotus.rk-international@kosei-kai.or.jp
**Senior Editor:** Shoko Mizutani
**Copy Editor:** P.A.D. Somapala, G.N. Ruklanthi
**Editor:** Shizuyo Miura
Editorial Staff of RK International

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදී නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. එහි සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මූලික කරගෙන කටයුතු කරනු ලැබේ. පවුල තුලත් ,කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.
වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මූලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් අප සැම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus Buddhism in Everyday Life（සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙදා දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.）යන තේමාව තුල, එදිනෙදා ජීවිතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවූ ලස්සන නෙළුම් මලක් සේ තම ජීවිතය සමෘද්ධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවූ සාමාජික සාමාජිකාවන් එදිනෙදා දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවූ අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදහැරීම සිදු කරනු ලැබේ.

# GUIDANCE BY PRESIDENT NIWANO

## ජ්‍යෙෂ්ඨයන්ගේ කාන්තිමත්බව

නිචිකෝ නිවානෝ
රිෂ්ෂෝ කෝසෙයි සංවිධාන ප්‍රධානී තුමා



### ආරම්භයට ගෞරව දැක්වීම

වර්තමාන ජපානයේ වයස අවුරුදු 75 ට වැඩි 'පසු අවධියේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්' ප්‍රමාණය මිලියන 16.41 යැයි ගණන් බලා තිබේ. මමද ඒ අතරින් කෙනෙකි. 'පසු අවධිය ' ජපන් අක්ෂර වලින් 後期 (ko~ki) ලෙසවේ. ඒ සමාන උච්චාරණය එන ලෙස 光輝 (ko~ki) අක්ෂර භාවිතා කර ලියූ ලිපියක් මට ලැබුණ අවස්ථාවක් තිබුනි. එම අක්ෂර 'දිප්තියෙන් කාන්තිමත්වන ' යනුවෙන් අර්ථය ගැබ් වී ඇත. වයස අවුරුදු 75 පසු වූවත් තව තවත් ' දිප්තියෙන් කාන්තිමත් වන ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ' ක්‍රියාශීලි ස්වභාවය මැවී සතුටුදයක හැඟීමක් සිතට ඇති විය.

එසේ වූවද , ඉතාමත් ක්‍රියාශීලි උනන්දු පුද්ගලයන් පමණක් 'දිප්තියෙන් කාන්තිමත්වන ජ්‍යෙෂ්ඨ පුරවැසියන්'වේ යැයි සිතුවද , එසේ නොවන අවස්ථාවන්ද තිබේ.

දෝගෙන් නම් සෙන් ගුරුවරයා ලියූ ප්‍රසිද්ධ කවියක් ඇත.
'වසන්තය සුන්දර මල් වලින්ද , ගිම්හාන කාලය කොවුල් හඬින්ද , සරත් සමය පුන්සඳ ආලෝකයෙන්ද, හේමන්ත සමය සීත හිමෙන් හමනා සිහිල් සුළඟින්ද හැඩවේ ' යනුවෙනි.

මෙම කවියේ වසන්ත , ගිම්හාන , සරත්, හේමන්ත කාලයන්හි , එකිනෙක ඍතු වලට ආවේනික , ස්වෛරීත්වයෙන් දිප්තියෙන් කාන්තිමත් බව විහිදී පැතිර තිබෙන බව පෙනේවි. අහසේත් , පොළොවේත්, ස්වභාව ධර්මයේ ක්‍රියාකාරිත්වය අනුව එසේ සිදු වූවත් ඒ එකිනෙක ඍතු ඉතා විශිෂ්ටය.

ඒ අනුව නිගමනය කළ හැකි වන්නේ , ඉතා ක්‍රියාශීලීව කටයුතු කිරීම පමණක්ම දීප්තිමත් කාන්තියෙන් බැබලෙන බව නොවේ. තම ජීවිත වල පසු අවධිය ගත කරන්නාවූ ජ්‍යෙෂ්ඨ අය වුවද මොහොතක් මොහොතක් පාසාම යථාර්තවාදීව , සත්‍යවාදීව බලා, නිරෝගීව ක්‍රියාශීලීව කටයුතු කිරීමට හැකිවීම හෝ නොහැකිවීම නොව , තමනට මේ දක්වා ජීවිතය ගත කිරීමට හැකිවීම ගැන කෘතවේදීව කටයුතු කිරීම නියම 'දිප්තියෙන් කාන්තිමත්වන ජ්‍යෙෂ්ඨ පුරවැසියන්' ලෙස අර්ථගැන්වේ යැයි සිතමි.

'ජීවත්වීමේ නියම සතුට දැනෙනුයේ වයෝවෘද්ධ සමයේය' යනුවෙන් ෆුසෙයි තොමියසු මහතා රචිත කවියක සදහන් වේ. එනම් ජීවිතයේ වසන්ත හෝ ගිම්හාන කාලයේ අවබෝධ නොවූ ඉතා වැදගත් දේ ජීවිතයේ සරත් කාලයේ දැනේවි. එම මනෝභාවය පුරා පැතිරීයන 'දිප්තියෙන් කාන්තිමත්වන ජ්‍යෙෂ්ඨ පුරවැසියන්' මානසිකත්වය මෙයින් පැහැදිලි වේ.

## බෝධිසත්වයන්ගේ කාන්තිය

ජ්‍යෙෂ්ඨ පුරවැසියන් තුල අනෙකුත් වයස් සීමාවල් වල නොමැති කාන්තියක් තිබෙනවා සේම , අසනීපයෙන් වේදනාව දැනෙන්නාවු යථාර්ත සිදුවීම්ද නැතැයි පැවසිය නොහැක. රෝග පීඩාවන්ට ලක්ව සිටින ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ පවුල් වල උපස්ථාන කටයුතු කරන්නාවු අයගේ පැත්තෙන් බැලූ කල 'දීප්තියෙන් කාන්තිමත් වන ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ' යන්න වචනයට පමණක් සීමා වී ඇති බව හැගෙයි. ඒවාගේම 'ඇප උපස්ථාන කළ යුතුය , ඒ වෙනුවෙන් මුදලුත් වියදම් වේ' ආදී සිතුවිලි පොදි ගහගෙන සිටින්නාවු අයද සිටියි.

නමුදු , අන්‍යයනට පැවසිය නොහැකි ආකාරයේ දුෂ්කරතා , සංකීර්ණ හැගීම් දරාගෙන දොස් පවරමින් ඇප උපස්ථන කලද , ඔවුනට 'ඉක්මන් සුවය ලැබේවායි' ප්‍රාර්ථනා කරමින් හදපත්ලෙන්ම ඒ වෙනුවෙන් කටයුතු කරයි. එලෙස අන්‍යයන් ගැන ගැඹුරින් සිතන්නාවු හැගීම් අවධිකරනු ලබන්නේ ඇප උපස්ථාන අවශ්‍යව සිටින්නාවු පවුලේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් බව නිසැකය. එසේ නම් උපස්ථාන කරන්නාවු පුද්ගලයාගේ මෛත්‍රියේ හා කරුණාවේ එළිය දැල්වීමට හේතු කාරකය වූයේ පවුලේ අසනීප වී සිටින ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්වරූපය බව පැවසීම සුදුසු යැයි මම සිතමි.

උදහරණයක් ලෙස , ඇඳේ වැතිර සිටින්නාවු කෙනෙකු වුවද 'දීප්තියෙන් කාන්තිමත් වන බෝධිසත්වයන්' ලෙස තමා අවට සිටින්නාවු පුද්ගලයන්ගේ සිත නැමැති කෙත වගා කරන්නාවු උදැල්ල හෝ නගුල බව අමතක නොකල යුතුය. අප නිර්මාතෘතුමා නිතරම පැවසු දෙයක් නම් ' තම ජීවිතයම දනයක් වන අයුරින් ගත කළ යුතුය' යනුවෙනි. එනම් අපගේ ජීවන ගමනේ ස්වරූපයද දනයක් බවට පත් කළ හැකිවේ.

මසහිරෝ යසුඔක නම් දර්ශනවේදියා පවසන ආකාරයට ' අධ්‍යාපනය , කලාව , ආගමික ක්‍රියාවන්ට මහත් ලැදිකමින් වැළඳගෙන කටයුතු කිරීම සදකාලික තරුණ බව පවත්වා ගැනීමේ රහස' වේ. නිරෝගිමත්ව යම් යම් කරුණු කාරණා ඉගෙන ගනිමින් , ඒ තුලින් සමාජ සත්කාරයන් කරමින් ජිවිතය ගත කිරීමද 'දීප්තියෙන් කාන්තිමත් වන ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ' ගේ දනමය ක්‍රියාවලි දිවිපෙවතයි.

අනිවාර්යයෙන්ම අප සංවිධානයේ ශාඛා වල සාමාජිකයින් , අප අමුතුවෙන් නොකීවත් එම ක්‍රියාවලියේ නියමාකාරයෙන් කටයුතු කරන අයයි. ඒ අය අප මධ්‍යස්ථාන වල ඉගෙන ගන්නාවු ධර්ම කරුණු පවුල තුලත් , සමාජයේත් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරයි. එය එක් එක් පුද්ගලයාගේ ජීවන ගමන බවට පත්ව , අවට සිටින්නාවු අයද සතුටට පත්වේ. එකිනෙකාට උදව් උපකාර කර ගැනීමද , එකිනෙකාගේ දුක සැප විමසීමද පුරුද්දක් බවට පත්වේ. එයින් ධර්ම මධ්‍යස්ථානය තුල අන්‍යයන් ගැන සිතන්නාවු සුන්දරත්වයෙන් පිරී පවති. ධර්ම මධ්‍යස්ථාන වල දක්නට ලැබෙන 'දීප්තියෙන් කාන්තිමත් වන ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ' ගේ ස්වරූපය අනිවාර්යයෙන්ම තරුණ පිරිසගේ ආදර්ශය බවට පත් වනවාසේම එක් එක් ප්‍රදේශයන්හි වැදගත් වු මෙහෙයන්ද ඉටු කරයි.

From *Kosei*, September 2016



# Child Care lifeline

## මට දරුවන් දෙදෙනෙකු සිටියි. නමුදු දෙදෙනාම එකලෙස 'සුරතල්' යැයි නොසිතේ.

**Q**

මාගේ වැඩිමහල් දියණියට වයස අවුරුදු 4 කි . නමුත් දැන් දැන් ඇය 'සුරතල්' යැයි නොසිතේ. ළඟදී දිනක මාගේ අත් වැරදීමකින් පිඟානක් බිදුණි. එවිට දියණිය මා ළඟට පැමිණ ' අයියෝ , අයියෝ , ආයෙත් කැඩුවද. කරන්න දෙයක් නැහැනේ ඉතින්' යැයි පැවසුවාය. ඇයගේ කථා විලාශය මම කථා කරන ආකාරයට සමානයි වාගේම කිසිම සුරතල් බවක් නොවීය. එවිට වයස අවුරුද්දක් වන පුතා කෙතරම් සුරතල්ද සිතේ. එමෙන්ම පුතා සමඟ වැඩිපුර කාලය ගත කරයි. මේ ගැටළුව විසඳ ගැනීමට මම කුමක් කළ යුතුද?

**A** දියණිය ' සුරතල් ' දරුවෙකු ලෙස නොසිතෙනවා යැයි පැවසුවත් , ඔබ ඉතා කාරුණික විශිෂ්ට මවකි. තම දියණිය තව දුරටත් සුරතල් දරුවෙකු ලෙස දැකීමට හා ඇයට වැඩිපුර අවධානය යොමු කිරීමට අවශ්‍ය යන හැඟීම ඇති නිසා ඔබ තැවෙන්නේය. එබැවින් තමා පිළිබඳ නැවත සිතා තම හැඟීම වැදගත් කොට සලකා එදිනෙදා දිවිය ගැන නැවත හැරී බලන්න.

පවුල් අධ්‍යාපනයේදී පවසන්නේ ' දෙමව්පියන්ගේ ඉරියව් හා ආකල්ප දරුවානේ අධ්‍යාපනයේ නියම මඟ' යනුවෙනි. දරු-වන් දෙමව්පියන්ගේ ඉරියව් හා ආකල්ප අධ්‍යනය කරමින් වර්ධනය වේ. දරුවන් දෙමව්පියන්ගේ වචන විලාශය හා ක්‍රියාවන් හොඳ හෝ නරක භේදයකින් තොරව උකහා ගනියි. දියණියද ඔබගේ කථා විලාශය ඒ ආකාරයෙන්ම අනුගමනය කරන්නේ ඔබට ගොඩාක් ආදරය කරන නිසාවෙනි. වැරදි අදහසකින් දරුවා එසේ කරනවා නොවේ. එදිනද ජීවිතයේ තමාට ඇසෙන දේ ප්‍රකාශ කරනවා පමණි.

' නිතරම දරුවා තමාගේ ස්වරූපය පෙන්වනවා' යනුවෙන් එය භාරගන්න. ඉන්පසු උණුසුම් හදවතින් දියණියට , අම්මගේ අතින් පිඟාන බිදුණු වෙලාවේ ඔයා ප්‍රවේසම් වෙන්න ලෙස කිව්වට බොහොම ස්තූතියි ' ලෙස පවසන්න.

එසේ කළ විට තමා සමඟ කාරුණිකත්වයෙන් හැඟීම් බෙදගන්නා මවගේ ස්වරූපය , දරුවාගේ හදතුල තැන්පත් වේ. අනෙක නම් , ඔබ පුතත් සමඟ වැඩි කාලයක් ගත කරන බැවින් දියණියට පාළුවක් දැනී ඇත. නමුත් ' මම අක්කා නිසා ' යනුවෙන් ඉවසීමට ඇය පුරුදු වී ඇත. නමුදු ඇයද කුඩා දරුවෙකි. විටෙක ' මවගේ අවධානය ගැනීමට අවශ්‍ය' යන හැඟීමට පත් වේ. එවැනි අවස්ථාවල දරුවාගේ හදවතට සමීපව කටයුතු කළ යුතුය.

දියණියගේ හෝ පුතාගේ යහපත් ක්‍රියාකාරකම් වලදී ඒ ගැන ප්‍රශංසා කරන්න. එවිට මබගේ ආදරය දියණියට දැනෙන්නට පටන් ගනීවී. වැඩිහිටි හෝ කුඩා යන භේදයකින් තොරව ප්‍රශංසා ලබන විට ඕනෑම කෙනෙක් සතුටට පත්ව හද පිරී යයි.

ඔබ දිගින් දිගටම මෙලෙස කටයුතු කිරීමට උත්සහ කළහොත් අනිවාර්යයෙන්ම දරුවන් දෙදෙනාම ' සුරතල් ' ලෙෂ හැගෙන තත්වයට පත් වේ යැයි සිතමි.

### Point 1 වචන හා ක්‍රියාව තුල සැගව ඇති හදවත තේරුම් ගනිමු

මවගේ වැරදි දෙස බලා , කටයුතු කරන්නාවු දරුවන්ගේ හැඟීම් පිළිබඳ අවධානය යොමු කරන්න. බාල දරුවාට වැඩිපුර කාලයක් වැයවන නිසා වැඩිමහල් දරුවාට ආදරයේ මදිපාඩුවක් දැනෙනවා නොවේද. 'මටත් අම්මගේ තුරුලට යන්න ඕනේ 'යන දරුවාගේ සැගව ඇති හදවතේ හැඟීම තේරුම් ගනිමු.

### Point 2 හැඟීම් වලට කථා කිරීමට කියාදීම

වයස අවුරුදු 4 වන විට තමාටම යම් යම් දෑ කිරීමට ඇති හැකියාව වර්ධනය වන නිසා දරුවන්ගෙන් ගෙදර වැඩට උදව් ලබා ගැනිම හොදය. එලෙස උදව්කරන විට දරුවන් අතින් පිඟානක් බිදුනු විට' ආයෙමත් කැඩුවා නේද' යනුවෙන් අවමන් නොකර , ' තුවාල වුනේ නැහැ නේද' ලෙස හදවතට කථා කළ යුතුය. එවිට දරුවා විසින් ඒ හා සමානව කෙනෙකු අතින් යම් දෙයක් සිදු වූ විට , එම පුද්ගලයාගේ හැඟීම් වලට කථා කරමින් ' ඔබට කරදරයක් නැහැ නේ' යනුවෙන් විමසීමට පුරුදු වේ.



පිලිතුරු සැපයීම ,
තෝකියෝ පවුල් අධ්‍යාපන හා පර්යේෂණ ආයතනය

තෝකියෝ පවුල් අධ්‍යාපන හා පර්යේෂණ ආයතනයේ සහයෝගිතාවයෙනි

*තෝකියෝ පවුල් අධ්‍යාපන හා පර්යේෂණ ආයතනය " පලමුව දෙමව්පියන් වෙනස් වුවහොත් දරුවා වෙනස කළ හැකියි" යන මුලික සිද්ධාන්තය පෙරදැරි කරගෙන ලොව පුරා සම්මන්ත්‍රණ පවත්වමින් දෙමව්පියන් දැනුවත් කරයි. " දරුවා තුලින් හදන පවුල් අධ්‍යාපනය" යන්න තුලින් බොහෝ දෙනා සිය පවුල සතුටෙන් පිරී ආලෝකමත් පවුල් සංස්ථාවක් බවට පත් කොට ගෙන ඇත.*

# Director's Column

## ධර්ම මාර්ගයේ ඇවිදයන්නේ මන්ද?

පසුගිය දිනක මොන්ගෝලියාවේ , උලාන්බාටර් ගුවන් තොටුපලේ තුල පොඩි සිදුවීමක් විය . එනම් ගුවන් යානා ගොඩබෑමේ පර්යන්තයේ ගමන් බඩු පිටතට පැමිණ බෙල්ටය දිගේ වටේ කැරකෙන විට එක් ගමන් මල්ලක් තල්ලුවී බිමට ඇද වැටුනි. එවිට ටිකක් දුරින් සිටි මොන්ගෝලියානු ජාතික මගියෙක් පැමිණ එය උස්සා නැවත බෙල්ටය මත තැබීය. ටික වේලාවකින් තවත් බෑගයක් ලිස්සා වැටුණි. එය දුටු වෙනත් මගියෙක් පැමිණ එය උස්සා නැවත බෙල්ටය මත තැබීය. ගමන් මලුවල අයිතිකරුවන් අපහසුතාවයට පත් නොවන ආකාරයට ඉබේම කටයුතු කළ එම මගීන්ගේ ස්වරූපය තුලින් , සියළු දෙනාම බුද්ධ ශක්තියෙන් යුතුයි, යන කියාදීම මතකයට නැගුණි.

අප තුල තිබෙන බුද්ධ ශක්තිය , අපම තේරුම් නොගනියි නම් , තව තවත් එය දියුණු කර ගැනීමට උත්සහ නොකරයි නම් අපතේ යනවා යැයි සිතමි. ලොව දසත දිග් භාගයේ අරගලයන් දිගින් දිගටම පැතිරි ත්‍රස්ත ක්‍රියාවන් නිතර සිදුවේ , අමනාපයන් දම්වැල දමයක් මෙන් සිදුවේ. මෙවැනි සිදුවීම් අපට අභියෝගයක් යැයි සිතමි. මන්ද, ‘ කුමන තත්වයකදී වුවද බුදුන්ගේ හදවතින් හා දෙවියන්ගේ හදවතින් ජීවත් වනවා යැයි ඒකාන්තයෙන්ම කටයුතු කරනවා’ එසේ නැතිනම් ‘ අප තුල තිබෙන එම වටිනා හැගීම නොතකා හරිනවා’ ද යන්න අප තීරණය කළ යුතුය නිසාවෙනි. අපිට එක් වරම 100% ක්ම ඒ අයුරින්ම කටයුතු කිරීමට නොහැකි වන්නට පුළුවන් , නමුත් එසේ පත් වීමට උත්සහ කිරීමට හැකිය. එබැවින් බුද්ධ ශක්තියෙන් යුතු එම හදවත අනුව ජීවත් වීම සදහා අපි ධර්ම මාර්ගයේ ඇවිද යන්නේ යැයි සිතමි.


රි.කෝ.කා. අන්තර්ජාතික මුලස්ථාන ප්‍රධානී
ශෝකෝ මුසුතනි මහතා





Rissho Kosei-kai International Branches

Rissho Kosei-kai

# Overseas Dharma Centers 2016

## Rissho Kosei-kai International
5F Fumon Hall, 2-6-1 Wada, Suginami-ku, Tokyo, Japan
*Tel:* 81-3-5341-1124 *Fax:* 81-3-5341-1224

### Rissho Kosei-kai International of North America (RKINA)
2707 East First Street Suite #1 Los Angeles
CA 90033 U.S.A
*Tel:* 1-323-262-4430 *Fax:* 1-323-262-4437
*e-mail:* info@rkina.org http://www.rkina.org

### Branch under RKINA

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003, U.S.A.
*Tel:* 1-253-945-0024 *Fax:* 1-253-945-0261
e-mail: rkseattle@juno.com
http:// www.buddhistLearningCenter.com

**Rissho Kosei-kai of Vancouver**

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
6083 Babcock Road, San Antonio, TX 78240, U.S.A.
*Tel:* 1-210-561-7991 *Fax:* 1-210-696-7745
*e-mail:* dharmasanantonio@gmail.com
http://www.rkina.org/sanantonio.html

**Rissho Kosei-kai of Tampa Bay**
2470 Nursery Rd.Clearwater, FL 33764, USA
*Tel*: (727) 560-2927
*e-mail*: rktampabay@yahoo.com
http://www.buddhismtampabay.org/

### Rissho Kosei-kai Buddhist Church of Hawaii
2280 Auhuhu Street, Pearl City, HI 96782, U.S.A.
*Tel:* 1-808-455-3212 *Fax:* 1-808-455-4633
*e-mail:* info@rkhawaii.org http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1817 Nani Street, Wailuku, HI 96793, U.S.A.
*Tel:* 1-808-242-6175 *Fax:* 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740, U.S.A.
*Tel:* 1-808-325-0015 *Fax:* 1-808-333-5537

### Rissho Kosei-kai Buddhist Center of Los Angeles
2707 East First Street, Los Angeles, CA 90033, U.S.A.
*Tel:* 1-323-269-4741 *Fax:* 1-323-269-4567
*e-mail:* rk-la@sbcglobal.net http://www.rkina.org/losangeles.html

**Rissho Kosei-kai Buddhist Center of Arizona**

**Rissho Kosei-kai Buddhist Center of Colorado**

**Rissho Kosei-kai Buddhist Center of San Diego**

**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**

**Rissho Kosei-kai Buddhist Center of Dallas**

### Rissho Kosei-kai of San Francisco
1031 Valencia Way, Pacifica, CA 94044, U.S.A.
*Tel:* 1-650-359-6951 *Fax:* 1-650-359-6437
*e-mail:* info@rksf.org http://www.rksf.org

**Rissho Kosei-kai of Sacramento**

**Rissho Kosei-kai of San Jose**

### Rissho Kosei-kai of New York
320 East 39th Street, New York, NY 10016, U.S.A.
*Tel:* 1-212-867-5677 *Fax:* 1-212-697-6499
*e-mail:* rkny39@gmail.com http://rk-ny.org/

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056, U.S.A.
*Tel :* 1-773-842-5654
*e-mail:* murakami4838@aol.com
http://home.earthlink.net/˜rkchi/

**Rissho Kosei-kai of Fort Myers**
http://www.rkftmyersbuddhism.org/

### Rissho Kosei-kai Dharma Center of Oklahoma
2745 N.W. 40th Street, Oklahoma City, OK 73112, U.S.A.
*Tel & Fax:* 1-405-943-5030
*e-mail:* rkokdc@gmail.com http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Buddhist Center of Klamath Falls**
1660 Portland St. Klamath Falls, OR 97601, U.S.A.

**Rissho Kosei-kai, Dharma Center of Denver**
1571 Race Street, Denver, Colorado 80206, U.S.A.
*Tel:* 1-303-810-3638

**Rissho Kosei-kai Dharma Center of Dayton**
635 Kling Dr, Dayton, OH 45419, U.S.A.
http://www.rkina-dayton.com/

### Risho Kossei-kai do Brasil
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP,
CEP 04116-060, Brasil
*Tel:* 55-11-5549-4446 / 55-11-5573-8377
*Fax:* 55-11-5549-4304
*e-mail:* risho@terra.com.br http://www.rkk.org.br

**Risho Kossei-kai de Mogi das Cruzes**
Av. Ipiranga 1575-Ap 1, Mogi das Cruzes-SP,
CEP 08730-000, Brasil
*Tel:* 55-11-5549-4446/55-11-5573-8377

### Rissho Kosei-kai of Taipei
4F, No. 10 Hengyang Road, Jhongjheng District, Taipei City 100, Taiwan
*Tel:* 886-2-2381-1632 *Fax:* 886-2-2331-3433
http://kosei-kai.blogspot.com/

**Rissho Kosei-kai of Taichung**
No. 19, Lane 260, Dongying 15th St., East Dist.,
Taichung City 401, Taiwan
*Tel:* 886-4-2215-4832/886-4-2215-4937 *Fax:* 886-4-2215-0647

### Rissho Kosei-kai of Tainan
No. 45, Chongming 23rd Street, East District, Tainan City 701, Taiwan
*Tel:* 886-6-289-1478 *Fax:* 886-6-289-1488

**Rissho Kosei-kai of Pingtung**

### Korean Rissho Kosei-kai
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
*Tel:* 82-2-796-5571 *Fax:* 82-2-796-1696
*e-mail:* krkk1125@hotmail.com

**Korean Rissho Kosei-kai of Busan**
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
*Tel:* 82-51-643-5571 *Fax:* 82-51-643-5572

### Branches under the Headquarters

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road,
North Point, Hong Kong,

Special Administrative Region of the People's Republic of China
*Tel & Fax:* 852-2-369-1836

**Rissho Kosei-kai of Ulaanbaatar**
15f Express tower, Enkh taiwnii urgun chuluu, 1st khoroo, Chingeltei district, Ulaanbaatar, Mongolia
*Tel:* 976-70006960
*e-mail:* rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Sakhalin**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk
693005, Russian Federation
*Tel & Fax:* 7-4242-77-05-14

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29-00184 Roma, Italia
*Tel & Fax :* 39-06-48913949
*e-mail:* roma@rk-euro.org

**Rissho Kosei-kai of the UK**

**Rissho Kosei-kai of Venezia**
Castello-2229 30122-Venezia Ve Italy

**Rissho Kosei-kai of Paris**
86 AV Jean Jaures 93500 Tentin Paris, France

### International Buddhist Congregation (IBC)
5F Fumon Hall, 2-6-1 Wada, Suginami-ku, Tokyo, Japan
*Tel:* 81-3-5341-1230 *Fax:* 81-3-5341-1224
*e-mail:* ibcrk@kosei-kai.or.jp http://www.ibc-rk.org/

## Rissho Kosei-kai of South Asia Division
5F Fumon Hall, 2-6-1 Wada, Suginami, Tokyo, 166-8537, Japan
*Tel:* 81-3-5341-1124 *Fax:* 81-3-5341-1224

### Rissho Kosei-kai International of South Asia (RKISA)
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel*: 66-2-716-8141 *Fax*: 66-2-716-8218
*e-mail*: thairissho@csloxinfo.com

### Branches under the South Asia Division

**Rissho Kosei-kai of Central Delhi**
224 Site No.1, Shankar Road, New Rajinder Nagar, New Delhi, 110060, India

**Rissho Kosei-kai of West Delhi**
66D, Sector-6, DDA-Flats, Dwarka
New Delhi 110075, India

**Rissho Kosei-kai of Kolkata**
E-243 B. P. Township, P. O. Panchasayar,
Kolkata 700094, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road
Rumpur, Gaya-823001, Bihar, India

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsilhel, Sancepa-1, Lalitpur,
Kathmandu, Nepal

**Rissho Kosei-kai of Singapore**

**Rissho Kosei-kai of Phnom Penh**
#201E2, St 128, Sangkat Mittapheap, Khan 7 Makara,
Phnom Penh, Cambodia

### Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel:* 66-2-716-8141 *Fax:* 66-2-716-8218
*e-mail:* info.thairissho@gmail.com

### Rissho Kosei-kai of Bangladesh
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
*Tel & Fax:* 880-31-626575

**Rissho Kosei-kai of Dhaka**
House#408/8, Road#07(West), D.O.H.S Baridhara,
Dhaka Cant.-1206, Bangladesh
*Tel:* 880-2-8413855

**Rissho Kosei-kai of Mayani**
Maitree Sangha, Mayani Bazar, Mayani Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Patiya**
Patiya, sadar, Patiya, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Domdama**
Domdama, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Cox's Bazar**
Ume Burmese Market, Main Road Teck Para, Cox'sbazar, Bangladesh

**Rissho Kosei-kai of Satbaria**
Satbaria, Hajirpara, Chandanish, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Laksham**
Dupchar (West Para), Bhora Jatgat pur, Laksham, Comilla, Bangladesh

**Rissho Kosei-kai of Raozan**
West Raozan, Ramjan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Chendirpuni**
Chendirpuni, Adhunagor, Lohagara, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Ramu**

### Rissho Kosei-kai Dhamma Foundation, Sri Lanka
382/17, N.A.S. Silva Mawatha, Pepiliyana, Boralesgamuwa, Sri Lanka
*Tel & Fax:* 94-11-2826367

**Rissho Kosei-kai of Polonnaruwa**

**Rissho Kosei-kai of Habarana**
151, Damulla Road, Habarana, Sri Lanka

### Other Groups

**Rissho Kosei-kai Friends in Shanghai**